**උතුරු මැද පළාත් සභාව - 2013**

---

උතුරු මැද පළාත් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුලත් විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටී ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටී සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ

ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කල මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 පළාත් සභා අරමුදල

පළාත් සභා අරමුදලට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

2.2.2 අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාලව 2014 අප්‍රේල් 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරිමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2013 වර්ෂයට අදාලව | | | ඉකුත් වර්ෂවලට අදාලව |
|---|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කල ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකල ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකල ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 30 | 30 | - | - |
| (ii) | ආදායම් ගිණුම් | 23 | 23 | - | - |
| (iii) | පළාත් සභා නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් | 61 | 47 | 14 | - |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 06 | 05 | 01 | - |
| (v) | අරමුදල් ගිණුම් | 07 | 01 | 06 | 17 |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 04 | 01 | - |
| (vii) | ස්වයං රැකියා වක්‍රීය ණය අත්තිකාරම් ගිණුම | 01 | 01 | - | 02 |
| | | 133 | 111 | 22 | 19 |

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පළාත් සභා අරමුදලේ සියළුම ආදායම් හා වියදම් මුදල් පදනම මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.4 ගණකාධිකරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණු රු.8,817,058,688 ක් වූ පුද්ගල පඩි නඩි සහ මෙහෙයුම් වියදමෙහි රු.4,663,675,773 ක මුළු වැටුප් හා වේතන ඇතුළත් නමුත් එකී වැටුප් හා වේතන වලින් අයකර ගෙන තිබුණු රජයේ නිලධාරීන්ට ණය හා අත්තිකාරම් මත වාරික හා පොලී, නිවාස කුලී යනාදිය වෙනුවෙන් අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. එකී හේතුවෙන් මුදල් ගලායාම් එකී අඩුකිරීම්වල ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව අනාවරණය කර ඇතත් පළාත් සභාවේ විවිධ ආයතනවලට අදාල 2013 දෙසැම්බර් 31 දිනට වූ රු.119,806,619 ක බැරකම්, ජංගම බැරකම් ලෙස සහ සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබුණු රු.494,620,243 ක වත්කම් ඇතුළුව පළාත් සභාව ආරම්භ කරන ලද 1988 මැයි 12 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පළාත් සභා අරමුදලින් මිලට ගෙන තිබුණු සියළුම වත්කම්, වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) උතුරු මැද පළාත් සභාව විසින් ආරම්භ කර පවත්වාගෙන යන නමුත් අනුමත ප්‍රඥප්තීන් මගින් ආවරණය නොවන එකතුව රු.19,340,075 ක් වූ අරමුදල් 04 ක වටිනාකම සහ සමාලෝචිත වර්ෂයේදී එකී අරමුදල් මත උපයාගෙන තිබුණු රු.1,832,096 ක් වූ පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

| | අරමුදල | පොලී ආදායම |
|---|---|---|
| | රු. | රු. |
| සුනාමි සහන අරමුදල | 151,972 | 445,315 |
| මාන්කුලම දුම්රිය ස්ථානය සංවර්ධන අරමුදල | 4,328,320 | 643,560 |
| රණවිරු සේවා අරමුදල | 6,102,235 | 9,589 |
| කෘෂි නිෂ්පාදන අලෙවි චක්‍රීය අරමුදල | 8,757,548 | 733,632 |
| | 19,340,075 | 1,832,096 |

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ප්‍රවාහයන් යටතේ දැක්විය යුතු රු.121,421,578 ක් වූ ආයෝජන පොලී ලැබීම් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ප්‍රවාහයන් යටතේ දක්වා තිබුණි.

## 2.2.5 නොසැසඳුණු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාව අනුව ගිණුම් විෂයයන් 06 ට අදාල ශේෂයන්හි එකතුව රු.3,636,315,085 ක් වූ අතර පාලන ගිණුම් අනුව එකී ශේෂයන්හි එකතුව රු.3,265,862,998 ක් විය.

| ගිණුම් විෂයය | පාලන ගිණුම | මූල්‍ය ප්‍රකාශන හා කාර්යය සාධන වාර්තාව අනුව ශේෂය | පාලන ගිණුම් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| රජයේ මූලධන ප්‍රදාන | 317 විසර්ජන ගිණුම | 3,134,869,730 | 3,109,471,581 | 25,398,149 |
| ආදායම් | ආදායම් ගිණුම් | 24,122,840 | 16,257,299 | 7,865,541 |
| පොදු තැන්පත් ගිණුම් 04 ක ශේෂයන් | පොදු තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම් සාරාංශ | 328,678,218 | 89,181,998 | 239,496,220 |
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 02 ක හර ශේෂයන් | අත්තිකාරම් ගිණුම් සඳහා වූ පාලන ගිණුම් සාරාංශ | 14,420,686 | 14,660,379 | (239,693) |
| වාණිජ අත්තිකාරම් ගිණුම් 02 ක හර ශේෂයන් | අත්තිකාරම් ගිණුම් සඳහා වූ පාලන ගිණුම් සාරාංශ | 28,288,263 | 25,218,263 | 3,070,000 |
| අග්‍රිම ශේෂයන් | අග්‍රිම ගිණුම් සඳහා වූ පාලන ගිණුම් සාරාංශ | 5,935,348 | 11,073,478 | (5,138,130) |
| | | 3,636,315,085 | 3,265,862,998 | |

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.

පහත සඳහන් නිරීක්ෂණයන් විය.

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කල විගණන විමසුම් අතරින් විගණන විමසුම් 24 කටද, ඉකුත් වර්ෂවල නිකුත් කල විගණන විමසුම් අතරින් විගණන විමසුම් 11 කටද 2013 නොවැම්බර් 03 දින වන විට ද පිළිතුරු ලැබී නොතිබුණු අතර එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනු වල වටිනාකම රු.2,246,081,395 ක් විය.

(ආ) පොත් පත් හා ලේඛන නොපැවැත්වීම

පළාත් සභාවේ විවිධ ආයතන 19 ක් විසින් සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛන, හානි හා පාඩු ලේඛන, බැරකම් ලේඛන, ලෙජර් ගිණුම්, ඉන්වෙන්ට්‍රි ලේඛන, ණයගැති / ණයහිමි ලේඛන හා අත්තිකාරම් ලේඛන යනාදිය නඩත්තු කර නොතිබුණි.

(ඇ) තොරතුරු ඉදිරිපත් නොකිරීම.

පහත නිරීක්ෂණයන් කෙරේ.

i. ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා පළාත් අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 02 ක් විසින් රු.1,162,408 කට මිලට ගෙන තිබුණු විවිධ උපකරණ එකී ප්‍රතිලාභීන්ට බෙදා දීමට අදාල ලැයිස්තු විගණනයට ඉදිරිපත් නොවීය.

| ආයතනය | මිලට ගෙන තිබුණු භාණ්ඩ | වටිනාකම |
|---|---|---|
| | | රු. |
| පළාත් පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව | කවකටු පෙට්ටි 1000, තේක්ක මේස 05 රෙදි සෝදන යන්ත්‍ර 01 | 294,600 |
| පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ශබ්ද විකාශන යන්ත්‍ර 02, ඇස්බැස්ටෝස් ෂීට් 318, උදළු තල 169, මහන මැෂින් 08 | 289,040 |
| පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ක්ලෝ ග්‍රෑම් 02 බැගින් වූ වී පැකට් 4000, පැරෂුට් තැටි 31150 | 578,768 |
| | | 1,162,408 |

ii. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, පට්ටි මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය පශු වෛද්‍ය මධ්‍යස්ථාන යනාදියට අයත් භූමි ප්‍රමාණයන් සහ ඒවායෙහි හිමිකාරත්වය තහවුරු කළ හැකි ඔප්පු හෝ හිමිකම් සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

iii. උතුරු මැද පළාත් සභාවේ පළමු නිල කාලයේදී ප්‍රවෘත්ති ඒකකය සඳහා මිලට ගෙන තිබුණු වටිනාකම අනාවරණය නොවූ වීඩියෝ කැමරා ඇතුළු සියළු උපකරණ අස්ථාන ගතවී ඇති අතර ඒවා ප්‍රධාන අමාත්‍යාංශයේ ගණකාධිකාරී වෙත 1999 වර්ෂයේදී භාරදී ඇති බවට සඳහන්ව ඇතත්, එකී උපකරණ ගණකාධිකාරීවරයා විසින් භාරගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ගෙවීම් වවුචර් ඉදිරිපත් නොකිරීම

ප්‍රධාන අමාත්‍යාංශයේ සහ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ එකතු වටිනාකම රු.19,329,891 ක් වූ ගෙවීම් වවුචර් 96 ක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.2.7 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) පනත් | |
| (i) 1958 අංක 13 දරණ සේවක අර්ථ සාධක අරමුදල් පනත සහ 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 20 දෙනෙකු වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු රු.943,559 ක අර්ථ සාධක අරමුදලේ දායකය හා රු.141,534 ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ දායකය ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 1987 අංක 42 දරන පළාත් සභා පනත | 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස සභා නායක, විපක්ෂ නායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන ධූරයන් ඇතිකර, එකී ධූරයන් සඳහා මන්ත්‍රීවරුන් පත්කර ඔවුන්ට පළාත් සභා මන්ත්‍රීවරයෙකුට හිමි නොවන වරප්‍රසාද ලබා දී එකී වරප්‍රසාද වෙනුවෙන් 2013 වර්ෂයේදී පළාත් සභා හා සභා ලේකම් කාර්යාලය විසින් රු.6,392,063 ක් ගෙවා තිබුණි. |
| (iii) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 20(1) වගන්තිය | ප්‍රධාන අමාත්‍යාංශය විසින් ලබාගත් සැපයුම් හා සේවා සඳහා බදු ඉන්වොයිසි ඉදිරිපත් නොකළ සැපයුම්කරුවන් 08 දෙනෙකු වෙත එකතුකළ අගය මත බදු වශයෙන් රු.1,727,135 ක මුදලක් ගෙවා තිබුණු අතර 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව එකී ගෙවීම් විස්තර විගණකාධිපතිට පිටපත් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි. |

(ආ) ආයතන සංග්‍රහය

--------------------

| | |
|---|---|
| XIX පරිච්ඡේදයේ 5.2 සහ 5.3 ඡේදය | අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම, රාජාංගනය යාය 05, ගලෙන්බිඳුනු වැව, කහටගස්දිගිලිය හා සේනපුර යන රෝහල් 05 ට අයත් නිල නිවාසවල පදිංචි නිලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.183,596 ක් වූ නිවාස කුලී අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. |
| XIX පරිච්ඡේදයේ 12 වැනි ඡේදය | ක්ෂේත්‍ර නිලධාරින්ට පරිවර්තිත ගමන් වියදම් දීමනාවක් ගෙවිය යුතු වුවත්, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී අනුරාධපුර දිස්ත්‍රික් පශු වෛද්‍ය කාර්යාලයේ සත්ත්ව සංවර්ධන නිලධාරියෙකුට දිවි නැඟුම ජාතික ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රවාහන දීමනා සහ සංයුක්ත දීමනා වශයෙන් රු.115,258 ක් ගෙවා තිබුණි. |

(ඇ) පළාත් මූල්‍ය රීති

--------------------

| | |
|---|---|
| (i) 177 | පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් සහතික නොකල වවුචර් 25 ක් මත රු.873,022 ක් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ii) 261.2.2 | තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දිය හැකි රු.100,000 ක උපරිම සීමාව ඉක්මවා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නුවරඑළියේ පවත්වා තිබුණු අධ්‍යාපන ගුණාත්මක වැඩසටහනක් වෙනුවෙන් රු.889,262 ක තත්කාර්ය අතුරු අග්‍රිමයක් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු වෙත ගෙවා තිබුණි. |
| (iii) 471.1 | පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙත ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබුණු රු.461,308 ක් වටිනා භාණ්ඩ සහ අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී මිලට ගෙන තිබුණු රු.4,603,942 ක් වටිනා ලී බඩු හා කාර්යාල උපකරණ අධ්‍යාපන අමාත්‍යාංශ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර නොතිබුණි. |
| (ඇ) 2004 ජනවාරි 04 දිනැති අංක සීඑස්ජ්/පී1/40 දරන අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛයේ 3.1 ඡේදය | පළාත් සභා අමාත්‍යවරයෙකු වෙත එක් නිල නිවාස දුරකතනයක් පමණක් ලබාදිය හැකි වුවත්, සමාලෝචිත වර්ෂයේදී පළාත් කෘෂිකර්ම අමාත්‍යවරයා වෙත නිල නිවාස 02 ක් සඳහා දුරකතන 03 ක් සපයා තිබුණි. |
| (ඉ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 11/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම වාහනවල ඉන්ධන දහනය මාස 06 කට වරක් පරික්ෂා කළ යුතු වුවත්, පළාත් සභාවේ වාහනවල ඉන්ධන දහනය පරික්ෂා කර නොතිබුණි. |
| (ඊ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | පළාත් සභා ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 කදී සිදුකර තිබුණු රු.1,634,831 ක් වූ භාණ්ඩ හා සේවා මිලට ගැනීම් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සිදුකර තිබුණි. |

### 2.2.8 ප්‍රමාණවත් අධිකාරී බලයක් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් විය.

(අ) දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂය ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනට පෙර ආපසු ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම් 25 ක නිරවුල් නොකල හර ශේෂයන්හී

එකතුව රු.385,183,708 ක් වූ අතර ඉන් සියයට 83 ක් වූ රු.318,744,138 ක ශේෂයක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පියවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 12 ක් විසින් නිරවුල් නොකල අග්‍රිම ශේෂයන් යටතේ දක්වා තිබුණු රු.11,136,395ක් වූ අග්‍රිම ශේෂයන් අවුරුදු 04 ට අධික කාලයක සිට පැවත එමින් තිබුණු අතර, එකී ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට එම ආයතනයන් සතුව ලිඛිත සාක්ෂි නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් භාණ්ඩාගාරය හා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිරවුල් නොකළ එකතුව රු.32,378 ක් වූ අග්‍රිම බැර ශේෂයක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 10 ක එකතුව රු.2,725,042 ක් වූ බැර ශේෂයන් සහ වාණිජ අත්තිකාරම් ගිණුමක රු.512,132 ක් වූ බැර ශේෂයක් වූ අතර එකී ශේෂයන් අතරින් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු නොකල හෝ බැර ශේෂයන් තවදුරටත් වර්ධනය වන ලෙස කටයුතු කල පළාත් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් විෂයයන් 03 ක ශේෂයන්හි එකතුව රු.1,685,324 ක් විය.

(ඉ) 2009 වර්ෂයට පමණක් පුහුණු දීමනා ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබුණු 2009 ජූලි 08 දිනැති අංක එන්සීපී/සීඑම්/ඊඩී/8/iii දරන ආණ්ඩුකාර ලේකම්ගේ ලිපිය පදනම් කරගෙන පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී ද අවස්ථා 12 කදී නර්තන හා සංගීත කණ්ඩායම් සඳහා පුහුණු දීමනා ලෙස රු.1,715,000 ක් ගෙවා තිබුණි.

(ඊ) ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ 2012 ජූලි 23 දිනැති අංක 25 දරන අතිරේඛයට අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.9.1 ප්‍රකාරව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය සහ සෘජු කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කරනු ලැබීමේදී රුපියල් මිලියන 2 කට අඩු ප්‍රසම්පාදන සඳහා වූ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ට, තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ට, විකල්ප සාමාජිකයින්ට, මාණ්ඩලික නිලධාරීන්ට සහ සෙසු සහායක නිලධාරීන්ට රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් ගෙවීම් නොකල යුතු වුවත් 2013 වර්ෂයේදී සිදුකල එකී සීමාවට අඩු ප්‍රසම්පාදන කටයුතුවලට අදාලව පළාත් සභාවේ ආයතන 09 ක් විසින් කමිටු 184 කට අදාලව රු.838,850 ක් එකී දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(උ) ඉංජිනේරුමය ඉදිකිරීම් සම්බන්ධ උපදේශාත්මක සේවාවන් ලබාදීම උතුරු මැද පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවත්, පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කඩ 50 අලෙවි සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරුමය උපදේශාත්මක සේවා

පෞද්ගලික උපදේශක සේවා ආයතනයකින් ලබාගෙන 2009 - 2013 කාලයේදී එම ආයතනයට රු.3,290,592 ක් ගෙවා තිබුණි.

(ඌ) ගරු මැති ඇමතිවරුන් හා ආණ්ඩුකාරවරයා වෙනුවෙන් වාර්ෂිකව රු.1,387,391 ක ජීවිත රක්ෂණ වාරික පළාත් සභා හා සභා ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂයෙන් ගෙවා තිබුණු අතර එකී ගෙවීම් සඳහා විධිමත් අනුමැතියක් හා එකී ගෙවීම් සනාථ කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලද ලදු පත් හෝ වෙනත් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

03. ආදායම් කළමනාකරණය

පළාත් සභාව විසින් ආදායම් ශීර්ෂ 23 ක් යටතේ රු.2,751,657,246 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබුණි. එය ඉකුත් වර්ෂයේ රු. .2,326,770,418 ක් වූ ආදායම සමඟ සැසඳීමේදී සියයට 18 ක එනම් රු.424, ක වර්ධනයක් පෙන්නුම් කරන නමුත් ඉකුත් වර්ෂයේ එහි සියයට 13 ක් වූ රු.255,161,918 ක වර්ධනයක් විය. එසේම සමාලෝචිත වර්ෂයේ ශීර්ෂ 23 යටතේ වූ එකී ආදායම පළාත් සභාවේ මුළු ආදායමින් සියයට 23 ක් වූ අතර එම ප්‍රතිශතය ඉකුත් වර්ෂයේ සියයට 25 ක් විය. ප්‍රධාන ආදායම් ශීර්ෂයන් කිහිපයක් පිළිබඳ විගණන නිරීක්ෂණයන් පහත දැක්වේ.

| ආදායම් ශීර්ෂ අංකය හා විස්තරය | ඇස්තමේන්තු ගත ආදායම | තථ්‍ය ආදායම | වැඩිවීම (අඩුවීම) | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 10-03-01-01- මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තු | 255,000,000 | 350,171,800 | 95,171,800 | 2013 ජනවාරි 01 දිනට පැවති රු.29,756,828 ක හිඟ ආදායම් වලින් අයකල ප්‍රමාණය හඳුනාගත හැකි ලෙස ගිණුම් තබා නොතිබුණි. |
| 10-02-07-00- මුද්දර ආදායම | 225,000,000 | 349,218,520 | 124,218,520 | සියයට 55 කින් ඇස්තමේන්තු ආදායම ඉක්මවා මුද්දර ආදායම රැස්කර තිබුණි. |
| 20-02-01-01 –නිවාස කුලී | 14,000,000 | 15,315,195 | 1,315,195 | ඇස්තමේන්තුගත ආදායම රු.1,315,195 කින් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී නිවාස කුලී එකතුකර තිබුණි. |
| 20-02-02-03 –- ආයෝජන පොලී | 90,000,000 | 121,421,578 | 31,421,578 | ඇස්තමේන්තුගත ආදායම රු.31,421,578 කින් ඉක්මවා ආදායම රැස්කර තිබුණු බැවින් ඇස්තමේන්තු කිරීම තාත්වික හා නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. |
| 10-02-12-00 ජාතිය | 1,625,000,000 | 965,554,103 | 659,445,897 | ඇස්තමේන්තුගත ආදායම |

| | | | | |
|---|---|---|---|---|
| ගොඩනැගීමේ බද්ද | | | | රු.659,445,897 කින් අඩුවෙන් සමාලෝචිත වර්ෂයේදී එකතු කර තිබුණි. |
| 20-03-03-04- මෝටර් වාහන මත දඩ | 5,000,000 | 19,497,218 | 14,497,218 | ඇස්තමේන්තුගත ආදායම සියයට 290 කින් ඉක්මවා ආදායම රැස්කර තිබුණු බැවින් ඇස්තමේන්තු කිරීම තාත්වික හා නිවැරදි නොවන බව නිරීක්ෂණය විය. |
| 10-02-09-00- ව්‍යාපාර පිරිවැටුම් බද්ද | 6,000,000 | 2,798,461 | 3,201,539 | ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 53 කින් සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ව්‍යාපාර පිරිවැටුම් බදු ආදායම පහත වැටී තිබුණි. |
| 10-02-04-05 - මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු | 24,000,000 | 16,254,046 | 7,745,954 | ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 32 කින් සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම පහත වැටී තිබුණි. |
| 10-02-07-01 දේපල පැවරීම මත මුද්දර ගාස්තු | 52,000,000 | 65,377,442 | 13,377,442 | ඇස්තමේන්තුගත ආදායම සියයට 26 කින් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී ආදායම් රැස්කර තිබුණි. |
| 10-02-05-04- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් මෝටර් රථ ලියාපදිංචි ගාස්තු පැවරීම | 50,000,000 | 97,207,570 | 47,207,570 | ඇස්තමේන්තුගත ආදායම සියයට 94 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. |
| 20-03-03-01 උසාවි දඩ | 180,000,000 | 152,413,895 | 27,581,105 | ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 15 කින් සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම පහත වැටී තිබුණි. |
| 20-02-01-03 ඉඩම් බදු | 70,000,000 | 73,989,734 | 3,989,734 | ඇස්තමේන්තුගත ආදායම රු.3,989,734 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. |

පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(අ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් එකතු කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්දෙන් 1/3 ක් එක් එක් පළාත් සභාවට ලබාදිය යුතු වුවත් උතුරු මැද පළාත් සභාවට අදාලව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් එකතු කල ජාතිය ගොඩනැගීම බදු මුළු ප්‍රමාණය කොපමණද යන්න හා දේශීය අදායම් කොමසාරිස් ජනරාල් විසින් පළාත් සභාවට ලබාදී ඇති මුදල එකතු කල බද්දෙන් 1/3 ක කොටසකට සමාන වේද යන්න පරීක්ෂා කර තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපාර පිරිවැටුම් බද්ද 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පිරිදි අහෝසි කර ඇති අතර සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කල යුතුව තිබුණේ හිඟ ව්‍යාපාර පිරිවැටුම් බදු රැස්කර ගැනීම

වුවත් පළාත් ආදායම් කොමසාරිස් විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු.6,000,000 ක ව්‍යාපාර පිරිවැටුම් බදු ආදායම් එකතු කිරීම සඳහා ඇස්තමේන්තුවක් සම්මත කරවාගෙන තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,179,420 ක් වූ දේපල පැවරීම මත මුද්දර ගාස්තු හිඟ ආදායමින් සමාලෝචිත වර්ෂය තුල අයකරගෙන තිබුණේ සියයට 42 ක් වූ රු.495,342 ක් පමණි. සමාලෝචිත වර්ෂයේ තක්සේරු ආදායම රු.52,000,000 ක් වූ අතර එකතු කල ශුද්ධ ආදායම රු.65,377,442 ක් වී තිබියදීත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.7,245,680 ක ආදායමක් හිඟව පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තු කිරීමේදී හඳුනා නොගත් රු.20,127,580 ක ආදායමක් වර්ෂය තුල රැස්කර ගෙන තිබුණු අතර ආදායම් ඇස්තමේන්තු කිරීම තාත්වික හා නිවැරදි නොවන බව එමගින් නිරීක්ෂණය විය.

(ඈ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් අධිකරණ දඩ අයකිරීම සඳහා උතුරු මැද පළාත තුල ඇති අධිකරණ වෙත එන්සි - 100 ආකෘති පත්‍ර නිකුත් කර ඇති නමුත්, එම පොත්වලින් අයකල දඩ පිළිබඳව පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණු අතර එකී හේතුව නිසා අධිකරණයන් විසින් ප්‍රේෂණය කරන ලද දඩ මුදල් ප්‍රමාණයේ නිවැරදිතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය. එසේම පාවිච්චි කල රිසිට් පොත් ආපසු ලබා ගැනීමකින් තොරව නැවත රිසිට් පොත් නිකුත් කර තිබුණි. අධිකරණයන් විසින් එකතු කරනු ලබන දඩ මුදල් සම්පූර්ණයෙන්ම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකෙරේ යන්න පළාත් ආදායම් කොමසාරිස්ගේ පිළිතුරු විය.

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් බදු අයවිය යුතු ඉඩම් ප්‍රමාණය හා අයවිය යුතු බදු ප්‍රමාණය පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම හේතුවෙන් ඉඩම් බදු ආදායම නිශ්චිතව ඇස්තමේන්තු කිරීමට නොහැකි වී ඇති අතර වර්ෂ අවසානයට හිඟ බදු ආදායම ගණනය කර ගැනීමටද නොහැකි වී තිබුණි.

(ඊ) 2012 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ ආදායම රු.123,498,097 ක් වුවත් 2013 වර්ෂය තුල රැස්කරගෙන තිබුණේ ඉන් සියයට 2 ක් වූ රු.2,726,736 ක් පමණක් විය. එය ඉකුත් වර්ෂයේ හිඟ ආදායම් රැස්කිරීමට සාපේක්ෂව ද සියයට 6 ක අඩුවීමකි.

(උ) එක් එක් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල ලියාපදිංචි මත්පැන් බලපත්‍රලාභීන් සංඛ්‍යාව එක් එක් වර්ෂවල රැස්කල යුතු බලපත්‍ර ගාස්තු ආදායම් ප්‍රමාණය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල ආදායම හා ප්‍රේෂණය නොකර රඳවාගත් ආදායම සහ බලපත්‍ර වාර්ෂිකව අළුත් නොකල බලපත්‍රලාභීන් සංඛ්‍යාව යනාදී විස්තර ලබාගත හැකිවන ආකාරයට මත්පැන් බලපත්‍රලාභීන්ගේ ලේඛනයක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි.

(ඖ) ලියාපදිංචි කල ව්‍යාපාර පිළිබඳ වාර්තා හා ලියාපදිංචි කිරීමේ සහතිකවල අනු පිටපත් එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මාසිකව ආදායම් ගණන්දීමේ නිලධාරී වෙත ලබා දී තිබුණද, එකී වාර්තා හා සහතිකවල අනුපිටපත් අනුව ලැබී ඇති ආදායමේ නිවැරදි බව තහවුරු කර ගැනීමකින් තොරව ආදායම් ගිණුම පිළියෙල කර තිබුණි

04. මූල්‍ය සමාලෝචනය
------------------------

4.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.102,194,257 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.729,914,922 ක් විය.

4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-----------------------------------------

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා මූලධන වියදම රු.1,024,578,920 කින් වැඩි වී ඇතත් මූල්‍ය ප්‍රතිඵලයද රු.627,720,665 කින් වර්ධනය වී තිබුණු අතර ඒ සඳහා රජයේ ප්‍රදාන රු.1,553,563,357 කින් සහ බදු සහ බදු නොවන ආදායම රු.98,736,228 කින් වැඩිවීම බලපා තිබුණි.

05. අධිකාරී ගිණුම්/අරමුදල් ගිණුම් හා වාණිජ අත්තිකාරම් ගිණුම්
----------------------------------------------------------------------

5.1 අධිකාරී ගිණුම්/අරමුදල් ගිණුම්
------------------------------------

උතුරු මැද පළාත් සභාව විසින් අනුමත කල ප්‍රඥප්ති යටතේ අධිකාරී 06 ක් පිහිටුවා ඇති අතර අරමුදල් 06 ක් ආරම්භ කර ඇත. විස්තර පහත දැක්වේ.

5.1.1 උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
----------------------------------------------------

අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 නොවැම්බර් 25 දින වන විටද ඉදිරිපත් කර නොතිබුණු අතර විගණනයේදී අනාවරණය වූ ප්‍රධාන නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) අධිකාරියේ සිවිල් ඉංජිනේරු (3ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගෙන තිබුණු නිලධාරියෙකුගේ සේවය ස්ථිර නොකර සේවා කාලය මාස 18 ක් ඉක්ම යාමටද පෙර උතුරු මැද පළාත් මාර්ග ව්‍යාපෘතියේ රාජකාරී කටයුතු සඳහා අවුරුදු 04 ක කාලයකට පූර්ණ කාලීනව නිදහස් කර තිබුණි. අධිකාරී සේවයට බඳවා ගත් දිනට පෙර පැවති පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ව්‍යාපෘතිවල අවුරුදු 12 ක සේවා කාලය සැලකිල්ලට ගෙන වැටුප් වර්ධක 08 ක් ලබා දී තිබුණු අතර 2009 අප්‍රේල් 01 දින සිට විගණිත දින වන විට ලබා දී තිබුණු එකී වැටුප් වර්ධක වාසිය රු.309,600 ක් විය. එසේම එකී සේවා කාලය සැලකිල්ලට ගෙන තීරු බදු නිදහස් වාහන බලපත්‍රයක් ලබාදීමට නිර්දේශ කිරීමෙන් ද රජයට අලාභයක් සිදුකර තිබුණි.

(ආ) අධිකාරිය විසින් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවීමෙන් පසු පුරප්පාඩු තනතුරු සඳහා සේවකයින් බඳවා ගැනීමේ පිළිගත් ක්‍රමවේදයෙන් බැහැරව පුරප්පාඩු තනතුරු නොතිබියදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයන් මත කම්කරුවන් 57 දෙනෙකු 2008 – 2013 කාලය තුල බඳවා ගෙන තිබුණු අතර එකී කම්කරුවන් වෙත 2011 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා වූ කාලය වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් රු.10,180,882 ක මුදලක් ගෙවා තිබුණි. එකී කම්කරුවන්ගෙන් 08 දෙනෙකු ප්‍රධාන අමාත්‍යවරයාගේ රාජකාරී සඳහා යොදවා ගෙන තිබුණි.

(ඇ) අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණු අධිකාරියේ කාර්මික නිලධාරිණියක් සිවිල් ඉංජිනේරු (4 ශ්‍රේණිය) තනතුරකට 2012 අප්‍රේල් 20 දින පත්කර තිබුණු අතර එදින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා කාලය සඳහා එකී උසස්වීමට අදාල වැටුප් හා දීමනා වශයෙන් රු.788,112 ක් එකී කාර්මික නිලධාරිණිය වෙත ගෙවා තිබුණි.

### 5.1.2 උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

---------------------------------------------------------------------------

ඒජන්සියට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් විය.

(අ) 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව ඒජන්සිය විසින් සමාලෝචිත වර්ෂයේදී ටයර් සේවා අංශයේ රු.1,878,286 ක ආදායම මත ගෙවිය යුතු රු.201,244 ක එකතු කළ අගය මත බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) 1980 අංක 46 සහ 1993 අංක 18 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනත ප්‍රකාරව එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනයන්හිදී නොගෙවීම නිසා ඒජන්සිය වෙත රු.254,246 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුව තිබුණි.

(ඈ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැඟීමේ බදු පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව ඒජන්සිය විසින් රු.220,809 ක ජාතිය ගොඩනැඟීමේ බදු නොගෙවීම හේතුවෙන් රු.40,390 ක දණ්ඩනයක් ආයතනයට එරෙහිව පනවා තිබුණි.

(ඇ) ඒජන්සිය විසින් භාවිතයෙන් ඉවත් කරන ලද ඩෝසර් අමතර කොටස් ඇතුළු යකඩ කිලෝ ග්‍රෑම් 75000 ක් විකිණීම සඳහා 2013 පෙබරවාරි 08 දින පුවත්පත් දැන්වීමක් පලකර තිබුණු අතර කිලෝ ග්‍රෑම් 50782 ක් රු.3,230,720 කට විකිණීමට තීරණය කර පසුව එකී තීරණය ප්‍රමාණවත් කරුණු දැක්වීමකින් තොරව අවලංගු කර තිබුණි. එසේ වුවද එකී තොගය 2013 අගෝස්තු 15 දින ටෙන්ඩර් මණ්ඩල තීරණයක් අනුව රු.1,070,191ක මූල්‍ය අලාභයක් සහිතව රු.2,160,229 කට විකුණා තිබුණි. භාවිතයෙන් ඉවත් කරන ලද රු.1,516,047 ක් වූ ඉතිරි ඩෝසර් අමතර කොටස් ඇතුළු යකඩ කිලෝ ග්‍රෑම් 24218 ක ප්‍රමාණය අස්ථාන ගතවී තිබුණි.

5.1.3 උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
---

අධිකාරිය විසින් ඉදිරිපත් කර තිබුණු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් ප්‍රකාශ කර නොතිබුණු අතර අධිකාරිය විසින් 2010 වර්ෂයේ සිට ණය පදනම මත ලබාදී තිබුණු විවිධ උපකරණ වල වටිනාකමින් 2013 ජූනි 30 දින වන විට එකී උපකරණ ලබාගත් ප්‍රතිලාභින්ගෙන් ආපසු අයකර ගතයුතු වූ රු.3,547,462 ක මුදලින් එදින වන විට අයකරගෙන තිබුණේ රු.1,535,885 ක් පමණක් විය. අයවීමට ඇති රු.2,011,577 ක් වූ ඉතිරි මුදල අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

5.1.4 උතුරු මැද පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය
---

අධිකාරියට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් විය.

(අ) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008/(iv) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරියේ සභාපතිවරයාට හා සාමාන්‍යාධිකාරීවරයාට හිමි ලීටර් 140 ක මාසික ඉන්ධන සීමාව ඉක්මවා ලීටර් 170 බැගින් ලබා දී තිබුණු අතර එක් නිලධාරියෙකුට රු.58,248 ක් බැගින් සමාලෝචිත වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබුණු ඉන්ධන වල වටිනාකම රු.116,496 ක් විය. එසේම එකී ඉන්ධන ප්‍රමාණයට අමතරව අධිකාරියේ සභාපතිවරයා හා සාමාන්‍යාධිකාරීවරයා වෙත ප්‍රධාන ලේකම් වරයාගේ පෞද්ගලික අනුමැතිය නොමැතිව බැහැර රාජකාරී සඳහා ලබාගෙන තිබුණු ඉන්ධන වෙනුවෙන් පිළිවෙලින් අවස්ථා 08 ක දීහා 07 කදී එකතුව රු.116,159 ක් හා රු.63,191 ක් ද ගෙවා තිබුණි.

(ආ) මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය විසින් බස්රථ පරීක්ෂකවරුන් 10 දෙනෙකු පත්කර ඇති නමුත් එකී නිලධාරීන්ට අමතරව අධිකාරියේ පරිපාලන නිලධාරී ඔහුගේ සාමාන්‍ය රාජකාරී වලින් බැහැරව, සමාලෝචිත වර්ෂයේ මුල් මාස 05 තුලදී පමණක් වැඩ කරන දින 69 කදී බස්රථ හා බස්නැවතුම්පල පරීක්ෂාවට යොදවා තිබුණු අතර ඒ සඳහා සංයුක්ත දීමනා වශයෙන් එකතුව රු.27,600 ගෙවා තිබුණි.

5.1.5 උතුරු මැද පළාත් පාරිසරික අධිකාරිය

--------------------------------------------

2012 ජනවාරි මාසයේදී පිහිටුවා ඇති මෙම අධිකාරියට අදාල සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.1.6 උතුරු මැද පළාත් හදිසි අවස්ථා අරමුදල

----------------------------------------------

අරමුදලට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් විය.

(අ) අරමුදල ආරම්භ කල 1990 වර්ෂයේ සිට එකී අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කිසිම කාර්යයක් සිදුකර නොතිබුණු අතර අරමුදල පිහිටුවීමේ ප්‍රඥප්තියෙන් ප්‍රතිපාදනයන් සලසා නොතිබියදී එකී අරමුදලින් එහි පොලී ආදායම වාර්ෂිකව ප්‍රධාන අමාත්‍ය අරමුදලට මාරු කර තිබුණි.

(ආ) අරමුදල පිහිටුවා අවුරුදු 23 ක් ඉක්ම ගොස් ඇතත් ප්‍රඥප්තියේ 20 (3) ප්‍රකාරව මෙම අරමුදල ක්‍රියාත්මත කිරීමට අවශ්‍ය රීති ආණ්ඩුකාරවරයා විසින් පිළියෙල කර නොතිබුණි.

5.1.7 උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල

-----------------------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ රු.5,185,974 ක් විය.

5.1.8 උතුරු මැද පළාත් දිරිදීමනා අරමුදල

----------------------------------------

සමාලෝචිත වර්ෂයේදී මෙම අරමුදලට අදාලව ප්‍රමාණාත්මක ගනුදෙනු සිදු වී නොතිබුණි.

5.1.9 උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන අරමුදල

2011 අංක 03 දරන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ප්‍රකාරව 2012 ජනවාරි මාසයේදී ආරම්භ කර තිබුණු මෙකී අරමුදලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,047,235 ක් වූ නමුත් එකී අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳවත් විගණකාධිපති විසින් විගණනය සිදුකලයුතු බවටත් විධිවිධාන ප්‍රඥප්තියට ඇතුලත් කර නොතිබුණි. එසේ වුවද ප්‍රඥප්තියේ 26 (2) වගන්තිය ප්‍රකාරව මෙම අරමුදල 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 3 කොටසේ විධි විධානවලට අනුකූල විය යුතු බව දක්වා ඇති බැවින් අරමුදල විගණනය විගණකාධිපති විසින් සිදුකල යුතුව ඇත. එමනිසා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් අරමුදල ආරම්භ කල වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.1.10 උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල

2005 ජනවාරි මාසයේදී ආරම්භ කර ක්‍රියාත්මක කර තිබුණු මෙකී අරමුදලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.8,331,893 ක් වූ නමුත් අරමුදල ආරම්භ කල වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයන්ට අදාල එහි මූල්‍ය ප්රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.1.11 උතුරු මැද පළාත් ළමා රක්ෂක සේවා අරමුදල

2008 ජනවාරි මාසයේදී ආරම්භ කර ක්‍රියාත්මක කර තිබුණු මෙකී අරමුදලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,021,552 ක් වූ නමුත් අරමුදල ආරම්භ කල වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයන්ට අදාල එහි මූල්‍ය ප්‍රකාශන 06 ක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර අරමුදලේ අරමුණුවලට පටහැනිව භාරකාර මණ්ඩලයේ අනුමැතියකින් තොරව පැහැසර පුවත්පත් මුද්‍රණය සඳහා 2012 හා 2013 වර්ෂවලදී රු.158,000 ක වියදමක් අරමුදලින් දරා තිබුණි.

5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

5.2.1 ස්වයං රැකියා චක්‍රීය ණය අත්තිකාරම් ගිණුම

අත්තිකාරම් ගිණුමට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් විය.

(අ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම මෙම අත්තිකාරම් ගිණුම් කටයුත්ත සඳහා පළාත් සභාව විසින් මුදල් ප්‍රතිපාදනය කර ඇති නමුත් එකී අත්තිකාරම් ගිණුමේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 සහ 2012 වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.2.2 තාර මිලට ගැනීමේ අත්තිකාරම් ගිණුම

---------------------------------------------

අත්තිකාරම් ගිණුම් කටයුත්තට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 නොවැම්බර් 25 දින වන විටද විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.2.3 පේෂ කර්මාන්ත කටයුතු අත්තිකාරම් ගිණුම

--------------------------------------------------

අත්තිකාරම් ගිණුමට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් විය.

(අ) පේෂකර්ම වාණිජ අත්තිකාරම් ගිණුමේ අරමුණ පළාතේ පාසල් හැර ගිය හා උසස් අධ්‍යාපන වරම් නොලද රැකියා විරහිත තරුණියන්ගේ ජීවනෝපාය මාර්ගයක් සඳහා අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය නව තාක්ෂණ ක්‍රමවේදයක් තුල පුහුණු කිරීම වුවද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් පේෂ කර්මාන්ත 43 ක, 65 ක් පමණ වන මුළු කාර්මිකාවන්ගෙන් සියයට 60 කගේ පමණ වයස අවුරුදු 35 – 65 ත් අතර වයස් කාණ්ඩයේ වන අතර ඔවුන්ගේ මාසික ආදායම සාමාන්‍යයෙන් රු.2,500 සිට 6,000 ත් අතර විය.

(ආ) 2013 වාර්ෂික ඇස්තමේන්තුවෙන් පේෂ කර්මාන්ත සඳහා 642 - 51- 4 වැය විෂයය යටතේ සලසා තිබුණු රු.35,187,000 ක ප්‍රතිපාදනයෙන් රු.33,585,365 ක වියදම් දරා තිබියදී සමාලෝචිත වර්ෂයේදී පේෂකර්ම වාණිජ අත්තිකාරම් ගිණුමේ රු.1,667,341 ක අලාභයක් සිදු වී තිබුණු අතර සමුච්චිත කාරක පාඩුව රු.7,708,106 ක් වී තිබුණි.

5.2.4 සත්ත්ව සංවර්ධන අත්තිකාරම් ගිණුම

------------------------------------------

තිරප්පනේ සත්ත්ව ගොවිපලේ සමාලෝචිත වර්ෂයේ වූ කිකිළි පැටවුන් 33325 කුගෙන් වර්ෂය තුලදී බෙදාහැර සහ මියගොස් තිබුණු පැටවුන් 28903 ක් ඉවත් කල පසු විය යුතු 4422 ක ශේෂය, තොග ලේඛනයේ 675 ක් ලෙස දක්වා තිබුණු අතර වටිනාකම රු.430,905 ක් වූ කිකිළි පැටවුන් 3747 ක වෙනසට හේතු පැහැදිලි නොකෙරුණි.

## 06. මෙහෙයුම් සමාලෝචනය

### 6.1 කාර්යය සාධනය

6.1.1 සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාව වෙත ලැබී තිබුණු සංවර්ධන ප්‍රදාන උපයෝජනය කිරීම සඳහා අනුමත කර තිබුණු, ක්‍රියාත්මක කර තිබුණු සහ නිමකර තිබුණු ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | උපමාන පාදක ප්‍රදාන | | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | | ලෝක බැංකු ආධාර | වෙනත් මූලධන වත්කම් ප්‍රදාන | සාමූහික ප්‍රදාන | |
|---|---|---|---|---|---|---|---|---|
| | නව ව්‍යාපෘති | අවිච්ඡේද ව්‍යාපෘති | නව ව්‍යාපෘති | අවිච්ඡේද ව්‍යාපෘති | නව ව්‍යාපෘති | අවිච්ඡේද ව්‍යාපෘති | නව ව්‍යාපෘති | අවිච්ඡේද ව්‍යාපෘති |
| අනුමත සංවර්ධන ව්‍යාපෘති ගණන | 421 | 45 | 379 | 483 | 42 | 479 | 45 | 15 |
| ක්‍රියාත්මක කල ව්‍යාපෘති ගණන | 393 | 44 | 359 | 483 | 37 | 450 | 45 | 15 |
| වර්ෂය තුල නිමකල ව්‍යාපෘති ගණන | 342 | 42 | 232 | 465 | 8 | 425 | 26 | 15 |
| අනුමත වියදම 000‘ | 587,274 | 39,883 | 492,013 | 401,233 | 274,397 | 161,432 | 69,938 | 5,062 |
| වර්ෂය තුල දැරූ වියදම 000‘ | 308,381 | 31,620 | 231,440 | 312,472 | 147,916 | 100,112 | 54,258 | 4,650 |

පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(අ) උපමාන පාදක ප්‍රදාන යටතේ අනුමත කර තිබුණු රු.587,274,060 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 421 කින් 393 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.308,380,692 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 342 ක් පමණි. එසේම සමාලෝචිත වර්ෂයට අවිච්ඡේදව පැවති රු.39,882,604 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 45 කින් 44 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.31,620,406 ක් උපයෝජනය කර තිබුණු අතර සංවර්ධන ව්‍යාපෘති 42 ක් නිමකර තිබුණි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අනුමත කර තිබුණු රු.492,012,802 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 379 කින් 359 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.231,439,935 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 232 ක් පමණි. එසේම සමාලෝචිත වර්ෂයට අවිච්ඡේදව පැවති රු.401,232,686 කට ඇස්තමේන්තු කර තිබුණු 483 ක් වූ සියළුම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඒ සඳහා රු.312,471,673 ක් උපයෝජනය කර තිබුණු අතර ව්‍යාපෘති 465 ක් පමණක් අවසන් කර තිබුණි.

(ඇ) ලෝක බැංකු ආධාර යටතේ අනුමත කර තිබුණු රු.274,397,000 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 42 කින් 37 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.147,915,880 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 08 ක් පමණි.

(ඈ) සාමූහික ප්‍රදාන යටතේ අනුමත කර තිබුණු රු.69,937,933 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 45 ම ක්‍රියාත්මක කර ඒ සඳහා රු.54,257,914 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 26 ක් පමණි. එසේ වුවද රු.5,062,067ක් වූ සමාලෝචිත වර්ෂයට අවිච්ඡේදව පැවති ව්‍යාපෘති 15 ම ක්‍රියාත්මක කර ඒ සඳහා රු.4,649,648 ක් උපයෝජනය කර තිබුණු අතර එකී සම්පූර්ණ ව්‍යාපෘති ප්‍රමාණයම නිමකර තිබුණි.

(ඉ) වෙනත් මූලධන වත්කම් ප්‍රදාන යටතේ අනුමත කර තිබුණු රු.161,432,121 ක් වූ නව සංවර්ධන ව්‍යාපෘති 479 කින් 450 ක් ක්‍රියාත්මක කර ඒ සඳහා රු.100,112,234 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුවද වර්ෂය තුල නිමකර තිබුණේ සංවර්ධන ව්‍යාපෘති 425 ක් පමණි.

6.1.2 2013 වර්ෂයේ උතුරු මැද පළාතේ අධ්‍යාපනය සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.5,974,506,000 ක මුදලක් වැයකර තිබුණු අතර ඉකුත් වර්ෂයේ එකී වියදම රු.5,459,995,880 ක් විය. සමාලෝචිත වර්ෂයේ උතුරු මැද පළාතේ විභාග ප්‍රතිඵල සමස්ථයක් ලෙස ගත් කල 5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස.(සා.පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) සමත් ප්‍රතිශතය පිළිවෙලින් සියයට 10, සියයට 63 හා සියයට 55 ක් විය. ඉකුත් වර්ෂයේ එකී ප්‍රතිශතය පිළිවෙලින් සියයට 15, සියයට 58.6 ක් සහ සියයට 57.58 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵලවල සියයට 4.4 ක වර්ධනයක් නිරීක්ෂණය වූ නමුත් 5 වසර ශිෂ්‍යත්වය හා අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵලවල පිළිවෙලින් සියයට 5 ක හා සියයට 2.58 ක පහත වැටීමක් නිරීක්ෂණය විය.

6.1.3 සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ රු.1,657,998,094 ක අගයකට වූ නව හා අවිච්ඡේද වැඩ යෝජනා 1354 ක් අනුමත කර තිබුණු අතර පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව ඒවා ක්‍රියාත්මක කිරීම සහ නිමකිරීම පිළිබඳ ප්‍රගතිය පහත දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|
| සම්පූර්ණයෙන් නිමකල | 472 | 546 | 918 |
| 75%- 90% අතර නිම කල | 123 | 18 | 141 |
| 50%- 75% අතර නිම කල | 150 | 03 | 153 |
| 50% කට වඩා අඩුවෙන් නිමකල | 122 | 02 | 124 |
| ආරම්භ කර නොතිබුණු | 08 | 10 | 18 |
| | 875 | 579 | 1354 |

පහත නිරික්ෂණයන්ද කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ රු.759,396,232 ක අගයකට වූ නව වැඩ යෝජනා 875 ක් අනුමත කර තිබුණු අතර ඉන් සම්පූර්ණයෙන්ම නිමකර තිබුණේ වැඩ යෝජනා 472 ක් පමණකි. වැඩ යෝජනා 123 ක් සියයට 75 ත් සියයට 90 ත් අතර ප්‍රතිශතයකින් නිමකර තිබුණු අතර සියයට 50 ත් සියයට 75 ත් අතර ප්‍රතිශතයකින් නිමකර තිබුණු වැඩ යෝජනා සංඛ්‍යාව 150 ක් විය. වැඩ යෝජනා 122 ක් සියයට 50 ට වඩා අඩුවෙන් නිමකර තිබුණු අතර වැඩ ආරම්භ කර නොතිබුණු වැඩ යෝජනා සංඛ්‍යාව 08 ක් විය.

(ආ) පළාත් සංවර්ධන සැලැස්ම යටතේ රු.898,601,862 ක අගයකට වූ අවිච්ඡේද වැඩ යෝජනා 579 ක් අනුමත කර තිබුණු අතර ඉන් වැඩ යෝජනා 546 ක් සම්පූර්ණයෙන්ම නිමකර තිබුණු අතර වැඩ ආරම්භකර නොතිබුණු වැඩ යෝජනා සංඛ්‍යාව 10 ක් විය. වැඩ යෝජනා 18 ක් සියයට 75 ත් සියයට 90 ත් අතර ප්‍රතිශතයකින් නිමකර තිබුණි. සියයට 50 ත් සියයට 75 ත් අතර ප්‍රතිශතයකින් නිමකර තිබුණු වැඩ යෝජනා සංඛ්‍යාව 03 ක් වූ අතර වැඩ යෝජනා 02 ක් නිමකර තිබුණේ සියයට 50 ට වඩා අඩු ප්‍රතිශතයකිනි.

6.1.4 පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ රු.19,882,419 ක් වූ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක 02 ක අතර නිවැරදි පදනමක් මත බෙදාහැර නොතිබුණු බව පහත සටහන අනුව නිරීක්ෂණය විය.

| | අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|---|
| ගොවි පවුල් සංඛ්‍යාව | 123,264 | 59,953 |
| කෘ.ප.නි.ස කොට්ඨාස | 426 | 187 |
| වෙන්කර තිබුණු ප්‍රතිපාදන (රු.) | 7,398,919 | 12,488,500 |
| ප්‍රතිපාදන වෙන්කිරීමේ ප්‍රතිශතය | 37 | 63 |

6.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාවේ ආයතන 24 ක් විසින් විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ශේෂයන්හි එකතුව රු.369,250,928 ක් වූ අතර, මෙකී ශේෂයන්හි ඇතුලත් රු.241,703,087 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) උතුරු මැද පළාත් මූල්‍ය රීති 369 හි විධිවිධානවලට අනුව කටයුතු නොකිරීම නිසා පළාත් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් විෂයයන් 02 ක වියදමේ උපරිම හර ශේෂ සීමාව රු.1,603,328 කින්ද, ගිණුම් විෂයක වියදමේ උපරිම සීමාව රු.32,262 කින්ද ඉක්මවා තිබුණු අතර ගිණුම් විෂයයන් 10 ක ලැබීම්වල අවම සීමාව රු.4,114,847 කින් පහත වැටී තිබුණි.

(ඇ) උතුරු මැද පළාත් සභාවට අයත් රෝහල් 10 ක රු.3,293,249 ක් වූ කල් ඉකුත් වූ සහ තත්ත්වයෙන් බාල ඖෂධ ඒකක 93080 ක් අපහරණය කිරිම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඈ) පළාත් සභාවේ ආයතනයන්හි 2013 දෙසැම්බර් 31 දිනට වූ රු.743,814,932 ක සේවක ණය අත්තිකාරම් ශේෂයන්හි ආයතන 21 ට අදාලව අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි රු.120,919,365 ක ශේෂයක් විය.

(ඉ) 2007- 2009 කාල පරිච්ඡේදයේදී පළාත් අධ්‍යාපන කාර්යාලයේ සහ කැබිතිගොල්ලෑව හා තඹුත්තේගම අධ්‍යාපන කාර්යාලවල නිලධාරීන්ගේ වැටුපෙන් අවකරණය කරගෙන තිබුණු රු.34,280,819 ක වැන්දඹු හා අනත්දරු දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර පොදු තන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඊ) පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට පිරිනැමීම සඳහා 2012 වර්ෂයේදී ලියන ලද රු.1,041,000 ක් වූ චෙක්පත් 155 ක් සහ 2013 වර්ෂයේදි ලියන ලද රු.924,918 ක් වූ චෙක්පත් 112 ක් වශයෙන් රු.1,965,918 ක් වූ චෙක්පත් 267 ක් 2014 මැයි 20 දින දක්වා අත රඳවා ගෙන තිබුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමූපකාර, වෙළඳ හා ආහාර, කුඩා කර්මාන්ත, පේෂ කර්මාන්ත, ග්‍රාම සංවර්ධන හා සංචාරක අමාත්‍යාංශය විසින් ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා දෙසැම්බර් මාසයේදී මිලට ගෙන තිබුණු රු.4,464,674 ක් වූ පා පැදි 117 ක්, පළතුරු ප්‍රවාහනය සඳහා වූ කූඩ 113 ක් සහ විකල්ප ලිප් 277 ක් 2014 ජූනි 17 දින වන විටද ප්‍රතිලාභීන් වෙත බෙදා දි නොතිබුණි.

(ආ) උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය සතුව සියළු පහසුකම් සහිත මුද්‍රණාලයක් සහ යකඩ පැස්සුම් අංශයක් සහිත අංග සම්පූර්ණ යාන්ත්‍රික වැඩපලක් තිබියදී ප්‍රධාන අමාත්‍යාංශය සහ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණ කටයුතු සඳහා රු.3,689,625 ක්ද, කොඩි කණු 110 ක් නිමකරවා ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.630,850 ක්ද පෞද්ගලික සැපයුම්කරුවන්ට ගෙවා තිබුණි. එමගින් පළාත් සභාව සතු අරමුදල් පළාත් සභාවේ ආයතන අතර සංසරණය වීම වලක්වා තිබුණු අතර පළාත් සභාව සතු සම්පත් ඌණ උපයෝජනයට ලක්කර තිබුණි.

(ඇ) ප්‍රධාන අමාතයාංශය විසින් උතුරු මැද පළාතේ ගොවීන් වෙත සමාලෝචිත වර්ෂයේදී බෙදා දී තිබුණු වර්ග 05 ට අයත් 4800 ක් වූ පළතුරු පැල ප්‍රමාණය උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සතු පැල තවාන් වලින් රු.282,000 කට මිලට ගැනීමට හැකිව තිබුණු නමුත් එකී පැල පෞද්ගලික පැල තවාන් වලින් රු.429,000 ක් ගෙවා මිලට ගෙන තිබුණි. එසේ කිරීම හේතුවෙන් පළාත් සභාවට රු.147,000 ක අලාභයක් සිදුව තිබුණු අතර පළාත් සභාව සතු අරමුදල් පළාත් සභාවේ ආයතන අතර සංසරණයවීමද වැලකී තිබුණි.

(ඈ) තඹුත්තේගම මූලික රෝහලේ කල් ඉකුත් වි තිබුණු රු.301,773 ක් වූ ඖෂධ සහ ශල්‍ය ද්‍රව්‍ය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) අක්කර 1078 රූඩ් 04 පර්චස් 23 ක් වූ ඉඩම් ප්‍රමාණක් දිඹුලාගල හා පොළොන්නරුව අධ්‍යාපන කලාපවල පාසල් 172 කට අයත්ව තිබුණු නමුත් එකී අයිතිය තහවුරු කිරීම සඳහා එම ඉඩම් වලට අදාල ඔප්පු හෝ හිමිකම් සහතික පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

6.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු
-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේ දි දිරි දිමනා ලෙස රු.2,005,387 ක් දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල නිලධාරින් වෙත ගෙවා තිබුණු නමුත් එම නිලධාරින් ඍජුවම ඉඩම් බදු ආදායම් රැස්කර ගැනිමට දායක වූ බව හෝ අදාල නිලධාරින්

ක්ෂේත්‍රයට ගොස් ඉඩම් බදුකරුවන්ගෙන් බදු මුදල් එකතු කළ බව හෝ සනාථ කෙරෙන සාක්ෂි නොතිබුණි. එසේම එම දිරි දීමනා ගෙවීම සඳහා හෝ දිරි දීමනා යෝජනා ක්‍රමය සඳහා හෝ විධිමත් අනුමැතියක් පළාත් ආණ්ඩුකාරවරයාගෙන් ලබාගත් බවටද සාක්ෂි නොතිබුණි.

(ආ) තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා මත පදනම්ව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් එකක් රු.61,810 බැගින් වූ VAT රහිත මිලකට ජල පොම්ප 3750 ක් රු.231,787,500 කට මිලට ගැනීමට ගෙන තිබුණු තීරණය, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබුණු නමුත් එකී ජල පොම්පවලට අමතරව ඒවායේ අමතර උපාංග කට්ටල 3750 ක් ද එකක් රු.5,252.80 ක් බැගින් වූ VAT සහිත මිලකට අමාත්‍ය මණ්ඩල තීරණය අභිබවා යමින් ප්‍රධාන අමාත්‍යාංශ කළමනාකරණය විසින් මිලට ගෙන රු.19,698,000 ක් ගෙවා තිබුණි. එසේම මිලට ගන්නා භාණ්ඩ ආයතන වෙත ලැබී තොග පොත්වල ඇතුළත් කිරීමෙන් පසුව පමණක් ගෙවීම් කළයුතු වුවත්, 2012 දෙසැම්බර් මාසයේදී මිලට ගෙන තිබුණු එකී උපාංග සහිත ජල පොම්ප වලින් වටිනාකම රු.93,100,000 ක් වූ ජල පොම්ප 1250 ක් 2014 වර්ෂය වන විටද සැපයුම්කරුගේ තඹුත්තේගම සහ අනුරාධපුර පිහිටි ගබඩාවල රඳවාගෙන තිබුණි.

(ඇ) පළාත් සභා ප්‍රධාන අමාත්‍යාවරයාගේ හා පළාත් සභා අමාත්‍යාවරුන්ගේ දීමනා සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල දීමනා සඳහා එක් එක් අමාංත්‍යාංශ වැය ශීර්ෂයන් යටතේ සලසා ඇති ප්‍රතිපාදන වලින් එකී සම්පූර්ණ දීමනා ගෙවා තිබුණු නමුත් එකී ගෙවීම්වලට අතිරේකව පළාත් සභා සහ පළාත් සභා ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂයෙන්ද 2013 වර්ෂයේදී රු.4,661,400 ක රියදුරු හා අනෙකුත් පෞද්ගලික කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණි.

(ඈ) 2007 නොවැම්බර් 19 දිනැති අංක CSA/P1/40 දරන චක්‍රලේඛ ලිපියෙන් සංශෝධිත 2006 ජනවාරි 04 දිනැති සහ 2006 ඔක්තෝබර් 23 දිනැති සමාංක දරන අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛ ලිපිවලින් නියම කර ඇති වාහන හා ඉන්ධන සීමාවන් ඉක්මවා ප්‍රධාන අමාත්‍යාවරයාට සහ ඔහුගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී වාහන 04 ක් සහ රු.7,615,271 ක ඉන්ධන ප්‍රධාන අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණි.

| තනතුර | ලබාදිය හැකි වාහන ප්‍රමාණය | ලබාදී තිබුණු වාහන සංඛ්‍යාව | සීමාව ඉක්මවා ලබාදී තිබුණු වාහන සංඛ්‍යාව | ලබාදිය හැකි ඉන්ධන ප්‍රමාණය | ලබාදිය හැකි ඉන්ධන ප්‍රමාණයේ වටිනාකම | ලබාදී තිබුණු ඉන්ධන ප්‍රමාණයේ වටිනාකම | සීමාව ඉක්මවා ලබාදී තිබුණු ඉන්ධන ප්‍රමාණයේ වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | | | ලීටර් | රු. | රු. | රු. |
| ප්‍රධාන අමාත්‍යවරයා | 03 | 06 | 03 | 7200 (P)<br>12000 (D) | 2,624,160 | 7,317,471 | 4,693,331 |
| පෞද්ගලික ලේකම් | 01 | 01 | - | 2880 (D) | 465,264 | 2,176,024 | 1,710,760 |
| මාධ්‍ය ලේකම් | 01 | 02 | 01 | 2612 (D) | 317,316 | 1,528,496 | 1,211,180 |
| | | | | | | | 7,615,271 |

(ඉ) 2007 නොවැම්බර් 19 දිනැති අංක CSA/P1/40 දරන චක්‍රලේඛ ලිපියෙන් සංශෝධිත 2006 ජනවාරි 04 දිනැති සමාංක දරන අතිගරු ජනාධිපතිතුමාගේ චක්‍රලේඛ ලිපියේ 1.1 ඡේදයට අනුව ගරු ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලය 15 කට සීමා විය යුතු වුවත් එකී සීමාව 30 කින් ඉක්මවා 45 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණු අතර සීමාව ඉක්මවා සේවයේ යොදවාගෙන තිබුණු සේවකයින් 30 දෙනා සඳහා සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා දීමනා සහ ගමන් වියදම් ලෙස රු.8,652,550 ක් ගෙවා තිබුණි.

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් නොසලකා තෝරාගෙන තිබුණු ආරක්ෂක සේවා සැපයුම්කරුවෙකු සමග ගිවිසුම්ගත නොවී එකී සැපයුම්කරු ප්‍රධාන අමාත්‍යාංශයේ ඇතැම් ගොඩනැගිලි සහ ප්‍රතිලාභීන් වෙත බෙදා නොහැර ඉතිරි වූ භාණ්ඩවල ආරක්ෂාව සඳහා යොදවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එකී සැපයුම්කරු විසින් රු.2,243,968 ක බිල්පත් ඉදිරිපත් කර තිබුණු අතර විගණිත දින වන විට රු. 1,486,240 ක් ගෙවා තිබුණි. එකී බිල්පත්වල උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සි භූමියේ වූ ගබඩාවක තිබුණු භාණ්ඩවලට 2013 ජනවාරි සිට මැයි දක්වා වූ කාලය තුල සැපයූ ආරක්ෂාව සඳහා වූ රු.504,560 ක බිල්පත් ද ඇතුලත්ව තිබුණි. එසේ වුවද එකී කාලය තුල සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය ආරක්ෂක සේවාවන් සපයාගෙන නොතිබුණු බව තහවුරු වී තිබුණු අතර අමාත්‍යාංශය විසින් ආරක්ෂක සේවාවන් අධීක්ෂණය

නොකර සැපයුම්කරු ඉදිරිපත් කර තිබුණු පැමිණීමේ ලේඛන මගින් පමණක් පැමිණීම තහවුරුකරගෙන ගෙවීම් කර ඇති බවනිරික්ෂණය විය.

6.5 දූශා අක්‍රමිකතා

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ලියසවිය හා තිරසාර ගම්මාන වැඩසටහන් සඳහා ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ රු.8,493,816 ක් වැය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණු රු.6,396,462 ක මුදල පුහුණු වැඩ සටහන් 22 ක් වෙනුවෙන් හා ග්‍රාම සංවර්ධන සමිති 19 ක් සඳහා රු.50,000 ක් බැගින් චක්‍රීය ණය ලබා දීම වෙනුවෙන් වැයකර තිබුණි.

(ආ) කැබිතිගොල්ලෑව අධ්‍යාපන කොට්ඨාශයේ ජාතික පාසල් හා පිරිවෙන් කාර්ය මණ්ඩල වැටුප් සැකසීම පවරා තිබුණු කැබිතිගොල්ලෑව කලාප අධ්‍යාපන කාර්යාලයේ ස්ථිර කාර්යාල කාර්ය සහායකයකු 2012 සැප්තැම්බර් මස සිට 2013 පෙබරවාරි මස දක්වා මාස 06 ක කාලයක් තුල ව්‍යාජ තොරතුරු පරිගණක ගතකර ව්‍යාජ නමක් සහිත බැංකු ගිණුමකට රු.410,629 ක මුදලක් බැරකර තිබුණි.

(ඇ) 2007 ජූලි සිට 2013 නොවැම්බර් දක්වා කාලය සඳහා සමෘද්ධි අධිකාරියෙන් රු.2,639,765 ක් වැටුප් හා දීමනා ලබාගෙන තිබුණු සමෘද්ධි අධිකාරිය වෙත අනුයුක්ත වී සිටි කැබිතිගොල්ලෑව අධ්‍යාපන කළාපයේ ගුරුවරයෙකු එකී කාලය සඳහා කැබිතිගොල්ලෑව කළාප අධ්‍යාපන කාර්යාලයෙන් ද රු.2,488,032 ක් වැටුප් හා දීමනා ලබාගෙන තිබුණි.

(ඈ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් මාසයේ බඹරකැලේ මිරිදිය සංවර්ධන මධ්‍යස්ථානයේදී ධීවර සමිති සාමාජිකයින් 60 දෙනෙකු සඳහා පවත්වා තිබුණු ධීවර ජලජීවී වගා කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහනට අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ඇතුළු 75 දෙනෙකු සහභාගී වී තිබුණු අතර එකී නිලධාරීන් සඳහා නවාතැන් සහ සියළු ආහාර පාන සැපයීම වෙනුවෙන් එක් අයෙකුට රු.2,800 ක් බැගින් රු.210,000 ක් හෝටලයකට ගෙවා තිබුණු නමුත් අමාත්‍යාංශ නිලධාරියෙකු විසින් ලබාගෙන තිබුණු අත්තිකාරම් මගින් ද ආහාර සපයා ගත් බවට ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කර රු.26,920 ක් ලබාගෙන තිබුණි.

(ඉ) 2013 ජූනි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාලයේදී පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ සේවක වැටුප් අවකරණ වලින් රු.400,000 ට අධික මුදලක් වංචනිකව

තමන්ගේ හා තම දරුවන්ගේ බැංකු ගිණුම්වලට මාරුකරගෙන තිබුණු කළමනාකරණ සහකාරවරිය වැඩ තහනමකට ලක්කර තිබුණු අතර විධිමත් විමර්ශනයක් කරන ලෙස පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව වෙත 2013 දෙසැම්බර් 24 දින දැනුම් දී තිබුණි. එසේ වුවද 2014 ඔක්තෝබර් 31 දින වන විටත් ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර නොතිබුණි.

## 6.6 අරමුදල් ඌණ උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූලධන වැය විෂයයන් 02 ක් යටතේ වූ එකතුව රු.72,900,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.52,997,589 ක් වූ සියයට 72 ක් ද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලධන වැය විෂයයන් 03 ක් යටතේ වූ එකතුව රු.9,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.5,715,451 ක් වූ සියයට 63 ක් ද උපයෝජනය කර නොතිබුණි.

## 6.7 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත විග්‍රහ කර ඇති පරිදි භෞතික සම්පත්, නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් ස්වාභාවය | සංඛ්‍යාව/වර්ග ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| (i) | ඉඩම් | අක්කර 110 | තක්සේරු කර නැත |
| (ii) | ගොඩනැගිලි | 406 | 17,954,028 (ගොඩනැගිලි 04 ක්) |
| (iii) | වාහන | 44 | තක්සේරු කර නැත |
| (iv) | යන්ත්‍රෝපකරණ | 01 | තක්සේරු කර නැත |
| (v) | කාර්යාල උපකරණ | 61 | 368,789 (එක අයිතමයක්) |
| (vi) | වෙනත් | 80 1/2 | 547,255 (අයිතම 04 ක්) |

පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(අ) පළාත් පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුව විසින් 2007 වර්ෂයේදී රු.4,771,517 ක වියදමකින් අළුතින් ඉදිකරන ලද මඩාටුගම ළමා රැඳවුම් මධ්‍යස්ථානය භාවිතයට ගෙන නොතිබුණු අතර 2010 සහ 2011 වර්ෂවලදී රු.2,616,183 ක වියදමකින් අළුත්වැඩියා කර තිබුණි. එසේම 2011 හා 2012 වර්ෂවලදී එකී මධ්‍යස්ථාන භූමියේ රු.2,526,923 ක වියදමකින් නිල නිවාසයක්ද ඉදිකර තිබුණි. එසේ වුවද රු.9,914,623 ක් වූ එකී ගොඩනැගිලි ඉදිකිරීම් සිදුකල දිනයේ සිටම ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රියව පැවතුණි.

(ආ) උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් වාහන 30 ක් අවුරුදු 05 කට ආසන්න කාලයක සිට ද පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ වාහන 02 ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ සිටද අළුත්වැඩියා කර පාවිච්චියට ගැනිමට හෝ අපහරණය කිරිමට හෝ කටයුතු නොකර දිරාපත් වෙමින් ආයතන පරිශ්‍රයන්හි ගාල් කර තිබුණි.

(ඇ) 2007 වර්ෂයේ නොවිධිමත් අධ්‍යාපනය වෙනුවෙන් වෙන්කරන ලද රු.354,781 ක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ 2007 වර්ෂයේ සිටද 2013 වර්ෂයේ අගෝස්තු මාසයේදී තඹුත්තේගම, කැකිරාව හා කැබිතිගොල්ලැව කලාපවලට නොවිධිමත් අධ්‍යාපනය සඳහා ලබාදුන් රු.660,900 ක් වූ මහන මැෂින් 14 ක් ඒවා ලබාදුන් මාසයේ සිටද නිශ්ක්‍රියව පැවතුණි.

(ඈ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2009 වර්ෂයේදී මිලට ගෙන තිබුණු වටිනාකම අනාවරණය නොවූ බේකරි උපකරණ කට්ටලයක් සහ 2012 වර්ෂයේදී මිලට ගෙන තිබුණු රු.2,296,800 ක් වූ සූර්ය ලන්තෑරුම් 145 ක් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ගබඩාවකද, 2012 වර්ෂයේදී මිලට ගෙන තිබුණු රු.12,214,832 ක් වූ ජල පෙරණ 1142 ක් සහ 2011 වර්ෂයේදී මිලට ගෙන තිබුණ රු.706,251 ක් වූ ප්ලාස්ටික් ඇසුරුම් 1183 ක් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියේ ගබඩාවකද, 2012 වර්ෂයේදී මිලට ගෙන තිබුණු රු.64,946,560 ක් වූ ජල පොම්ප 872 ක් සැපයුම්කරුගේ ගබඩාවකද බෙදාහැරීමට කටයුතු නොකර නිෂ්ක්‍රීයව රඳවා තිබුණි.

(ඉ) අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් පාසල් 541 ක සහ දිඹුලාගල හා පොළොන්නරුව අධ්‍යාපන කලාප වල පාසල් 93 ක බැංකු ගිණුම්වල 2013 දෙසැම්බර් 31 දිනට රු.44,773,631 ක පාසල් ගුණාත්මක යෙදවුම් මුදල් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඊ) පළාත් සභාවේ ආයතන 03 ක අවුරුදු 05 ට අධික කාලයක සිට අක්‍රීයව පැවති ජංගම ගිණුම් 09 ක වූ රු.2,214,517 ක ශේෂයක් 2013 දෙසැම්බර් 31 දිනට නිෂ්ක්‍රීයව පැවතුණි.

6.8. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

පළාත් සභා මූල්‍ය රීති 476.1 ප්‍රකාරව පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 16 ක සමාලෝචිත වර්ෂයට අදාලවද අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 04 ක ඉකුත් වර්ෂයට අදාලවද භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

6.9 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් විය.

(අ) 2013 වර්ෂයේදී පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලීටර් 110 ක ප්‍රමාණයේ කසල බඳුන් 253 ක් මිලට ගැනීම සඳහා මිල ගණන් කැඳවා තිබුණු අතර එහිදී ලීටර් 100 ක කසල බඳුනක් රු.1,630 බැගින් සැපයීමට සැපයුම්කරුවෙක් ඉදිරිපත් කර තිබුණු මිල ගණන් ලීටර් 10 ක ධාරිතාව අඩුවීම හේතුකොට ගෙන ප්‍රතික්ෂේප කර පියනක් රහිත මාස 06 ක වගකීම් කාලයක් සහිත ලීටර් 110 ක ප්‍රමාණයේ කසල බඳුනක් රු.5,250 ක් බැගින් කසල බඳුන් 253 ක් රු.1,328,250 කට මිලට ගෙන තිබුණි. ලීටර් 100 කසල බඳුන් මිලට ගැනීමට තීරණය කලේ නම් වසරක වගකීම් කාලයක් සහ පියනක් සහිත කසල බඳුනක් ප්‍රතිලාභීන්ට ලබාදීමට හැකියාව තිබුණු අතර කසල බඳුන් 253 ක් රු.412,390 කට මිලට ගැනීමට ද රු.915,860 ක් ඉතිරි කරගැනීමට ද හැකියාව තිබුණි.

(ආ) අමතර කොටස් ලබාගැනීමේ පහසුව, නඩත්තු වියදම් සහ ඉන්ධන පිරිමැස්ම යනාදී කරුණු පිළිබඳ අවධානය යොමු නොකර ප්‍රධාන අමාත්‍යාංශයේ අවශ්‍යතාවය සඳහා ප්‍රධාන ලේකම් විසින් 2004 සහ 2006 වර්ෂවලදී මිලට ගෙන තිබුණු ඇමරිකාවේ නිෂ්පාදිත වටිනාකම අනාවරණය කරගත නොහැකි වූ පෙට්‍රල් වාහන 02 ක් අධික ඉන්ධන දහනය හේතුවෙන් 2012 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි.

(ඇ) රෝහල් කාර්යමණ්ඩලය 25 ක් පමණ විමත් රෝහල ආසන්නයේම වෙනත් පෞද්ගලික ආපනශාලා කිහිපයක්ම පිහිටා තිබීමත් නිසා 2012 වර්ෂයේදි රු.1,262,483 ක් වියදම් කර ඇලයාපත්තුව ප්‍රාදේශීය රෝහලෙහි ඉදිකර තිබුණු ආපනශාලාව වසා දමා තිබුණු අතර ආපනශාලාව ඉදිකිරීම සඳහා දරා ඇති වියදම වෙනත් වැදගත් කාර්යයකට යෙදවීමේ හැකියාව මගහැරී තිබුණි.

6.10 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් ලබාගත් තාක්ෂණික ඇගයීම් වාර්තාවක් පදනම් කරගෙන ප්‍රධාන අමාත්‍යාංශය විසින් බඩ ඉරිඟු බීජ මිලට ගෙන තිබුණි. එසේ වුවද එකී ඇගයීම් වාර්තාවෙන් නිර්දේශ කර තිබුණු කිලෝග්‍රෑම් 01 ක් රු.720 ක් වූ S-A-501 වර්ගයේ දෙමුහුම් බඩ ඉරිඟු බීජ මිලට ගැනීමට කටයුතු නොකර කිලෝග්‍රෑම් 01 ක් රු.905 ක් වූ පැසිපික් 984 වර්ගයේ මිල අධික දෙමුහුම් බඩ ඉරිඟු බීජ කිලෝග්‍රෑම් 5500 ක් රු.4,977,500 කට මිලට ගෙන තිබුණි. එසේ කිරීමෙන් ප්‍රධාන අමාත්‍යාංශය රු.1,017,500 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. එකී මුදලින් සියයට 50 ක ප්‍රතිලාභී දායකත්වය ඉවත් කළ පසු පළාත් සභාවට සිදු වී තිබුණු ශුද්ධ මූල්‍යමය අලාභය රු.508,750 ක් විය.

(ආ) උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය 2013 වර්ෂයේ කෘෂි සංවර්ධන සමුපකාර සමිති සාමාජිකයින් සඳහා ආනයනික දෙමුහුන් බඩඉරිඟු බිජ කිලෝ ග්‍රෑම් 5000 ක් සහ දියර ඉසින යන්ත්‍ර 500 ක් මිලට ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටු නිසි වෘත්තීය සැලකිල්ලකින් තොරව කටයුතු කිරීම සහ තාක්ෂණික පිරිවිතරයන්ට ඇතුලත් නොවූ කරුණු සැලකිල්ලට ගෙන වෙළඳපල මිල ගණන් පිළිබඳ නිසි අවබෝධයකින් සහ වගකීමකින් තොරව අනුචිත නිර්දේශ ඉදිරිපත් කිරීම නිසා අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර වැඩි මිල ගණන් මත මිලට ගෙන තිබුණු අතර එමගින් රු.1,213,500 ක පාඩුවක් පළාත් සභාවට සිදුවී තිබුණි.එසේම 2012 වර්ෂයේදී දියර ඉසින යන්ත්‍ර සැපයීමට එකඟ වූ සැපයුම්කරු උචිත භාණ්ඩ නොසැපයීම හේතුවෙන් මුදල් කල සුරැකුම්වල රු.387,700 ක් වු වටිනාකම 2013 වර්ෂයේ දියර ඉසින යන්ත්‍ර මිලට ගැනීමට අදාල සියයට 50 ප්‍රතිලාභී දායකත්වය සඳහා හිලව්කර තිබුණු අතර එමගින් එකී ප්‍රමාණයෙන් රජයට ආදායම් අහිමි කර තිබුණි.

(ඇ) රාජාංගනය යාය 05 ප්‍රාදේශිය රෝහලේ ඖෂධ ගබඩාවේ වර්ග 03 කට අයත් වටිනාකම රු.94,358 ක් වු ඖෂධ ඒකක 60,080 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

(ඈ) සාලියපුර වැඩිහිටි නිවාසය සඳහා වියළි ආහාර ද්‍රව්‍ය වර්ග 23 ක් සහ ඉදිආප්ප සැපයීමේදී වෙළඳපලේ පවතින මිල ගනන් වලට වඩා වැඩි මිල ගනන් මත ටෙන්ඩර් පිරිනැමීම නිසා සමාලෝචිත වර්ෂයේදි රජයට සිදු වී තිබුණු අලාභය රු.885,955 ක් විය.

6.11 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මැදවච්චිය පශු වෛද්‍ය කාර්යාලය සහ නිල නිවස අළුත් වැඩියා කිරීම සඳහා වූ 2008 නොවැම්බර් 06 දිනැති රු.1,792,393 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාර මාස 01 දින 25 ක් තුල වැඩ නිම කර භාර දිය යුතුව තිබුණු එකී ව්‍යාපෘතියේ සියළුම වැඩ කොටස් නිම කර භාරදී නොතිබුණු බව 2013 අගෝස්තු 29 දින සිදුකල භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය. එසේ වුවද ගිවිසුම් ප්‍රකාර 2013 අගෝස්තු 29 දිනට වූ රු.516,504 ක ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ 2011 මාර්තු 09 දිනැති අංක 22 අතිරේඛය ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් ප්‍රදානයේදී යම් සංවිධානයකට දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්වල ඉතිරි කොටසේ මුළු වටිනාකමෙහි සහ යෝජිත කොන්ත්‍රාත්තුවේ වටිනාකමෙහි එකතුව රුපියල් මිලියන 2 ක් නොඉක්මවිය යුතු අතර අදාල සමිතිය අතැති කොන්ත්‍රාත් ගණන 03 නොඉක්මවිය යුතු වේ. එසේ වුවද පහත විස්තර දැක්වෙන පළාත් දෙපාර්තමේන්තු 02 ක් විසින් ඊට පටහැනිව කටයුතු කල අවස්ථා විය.

| ආයතනය | පිරිනමා ඇති කොන්ත්‍රාත් සංඛ්‍යාව | පිරිනමා ඇති කොන්ත්‍රාත් වල වටිනාකම |
|---|---|---|
| | | රු. |
| පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 05 | 2,787,624 |
| අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 01 | 2,239,483 |
| උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 03 | 2,869,176 |

(ඇ) ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන 14 ක් ඉක්මවා තිබුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීම සඳහා මුල්‍ය රීති 422.1 ප්‍රකාරව විවෘත තරඟකාරී මිල ගණන් කැඳවා අමාත්‍ය මණ්ඩලය පත්කල

ප්‍රසම්පාදන කමිටුවක් මගින් කොන්ත්‍රාත්කරුවකු තෝරාගත යුතුව තිබුණි. අමාත්‍ය මණ්ඩලය පත්කල ප්‍රසම්පාදන කමිටුව වෙත පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් ඉදිරිපත් කර තිබුණු කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකුගේ නාම ලේඛනයක් පදනම්කරගෙන සීමිත ලංසු කැඳවීම් කර තිබුණි. එසේ වුවද අමාත්‍යාංශ ලේකම්වරයා කොන්ත්‍රාත්කරුවන් 05 කු තෝරාගැනීම විනිවිද භාවයකින් සිදුකල බවට සාක්ෂි නොතිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.4.1 ප්‍රකාරව සීමිත මිල ගණන් කැඳවීමේදී ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සියල්ලන්ගෙන්ම ලංසු කැඳවා නොතිබුණි.

## 6.12 කාර්ය මණ්ඩල පරිපාලනය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ආයතන

| | | අනුමත | තථ්‍ය | අතිරික්ත | (ඌණතාවය) |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ | 601 | 305 | - | (296) |
| (ii) | තෘතීයික | 320 | 225 | - | (95) |
| (iii) | ද්විතියික | 3534 | 2134 | - | (1400) |
| (iv) | ප්‍රාථමික | 1694 | 1213 | - | (481) |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික) | 26 | 665 | 639 | - |
| | | 6175 | 4542 | 639 | (2272) |

### 6.12.1 පහත නිරීක්ෂණයද කරනු ලැබේ.

පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 345 ක් වුවත් 2013 දෙසැම්බර් 31 දිනට තනතුරු පුරප්පාඩු 172 ක් පැවතුණු අතර ඉන් තනතුරු 118 ක් කෘෂිකර්ම සංවර්ධනයට සෘජු ලෙසම සම්බන්ධ බව නිරීක්ෂණය විය. එකී තනතුරු දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවතීම උතුරු මැද පළාතේ කෘෂි ව්‍යාප්ති කටයුතුවල හා කෘෂි සංවර්ධනයේ දක්නට ඇති පසු බෑමට හේතු වී ඇත. එසේම දෙපාර්තමේන්තුවේ

පවතින කම්කරු තනතුරු පුරප්පාඩු 22 ක් පිරවීමට කටයුතු නොකර 2009 නොවැම්බර් 25 දිනෙන් පසු ස්ථිර තනතුරුවල පුරප්පාඩු සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය නොමැතිව තාවකාලික, අනියම්, ආදේශක කොන්ත්‍රාත් සහ සහන පදනමින් සේවකයන් බඳවා නොගත යුතු බව දක්වා තිබුණු 2009 නොවැම්බර් 25 දිනැති අංක 20/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදයේ විධිවිධාන වලට පටහැනිව එදිනෙන් පසු අනියම්/ආදේශක කම්කරුවන් 34 දෙනෙකු උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් බඳවාගෙන තිබුණි.

6.12.2 පාසල් කාර්යය මණ්ඩලයේ අනුමත, තථ්‍ය, අතිරික්ත හා ඌණතා පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | අනුමත | තථ්‍ය | අතිරික්ත | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | විදුහල්පති | 998 | 798 | - | 200 |
| (ii) | ගුරුභවතුන් | 15940 | 13821 | - | 2119 |
| (iii) | ගුරු සහායක | - | 590 | 590 | - |
| (iv) | සැලසුම් හා මූල්‍ය සහකාර/ සංවර්ධන සහකාර/ වැඩසටහන් සහකාර/ විද්‍යාගාර සහායක/ නේවාසිකාගාර පාලක | 878 | 60 | - | 818 |
| (v) | සුළු සේවක | 757 | 62 | - | 695 |
| (vi) | වෙනත් | - | 25 | 25 | - |
| | | 18573 | 15356 | 615 | 3832 |

පහත නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(අ) ගලෙන්බිඳුණුවැව, කැකිරාව, තඹුත්තේගම, අනුරාධපුර හා කැබිතිගොල්ලෑව අධ්‍යාපන කළාපවල පාසල් වලට අයත් ගුරුවරු 19 කු සහ කළමණාකරණ සහකාර සේවයේ නිලධාරියෙකු පළාත් සභාවේ හා මධ්‍යම රජයේ ආයතන වෙත මුදාහැර තිබුණු අතර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුලදී එකී නිලධාරීන් වෙත රු.5,322,057 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. එසේ වුවත් අදාල ආයතන වෙතින් එම මුදල් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් දිඹුලාගල, ගලෙන්බිඳුණුවැව සහ අනුරාධපුර අධ්‍යාපන කළාපවලට අයත් මහා විද්‍යාල 03 ක සහ ප්‍රාථමික විද්‍යාල 06 ක නියෝජ්‍ය විදුහල්පතිවරු ලෙසද හිඟුරක්ගොඩ අධ්‍යාපන කළාපයේ ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් 10 දෙනෙකු මහා විද්‍යාලවල වැඩ බලන

විදුහල්පතිවරු ලෙස ද පත්කර තිබුණු අතර මහා විද්‍යාල 04 ක් ඇතුළු පාසල් 141 ක වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස ගුරු සේවයේ 1, 2-1, 2-11 සහ 3-1 ශ්‍රේණිවලට අයත් ගුරුවරුන් අනියුක්ත කර තිබුණි.

(ඇ) කැබිතිගොල්ලෑව හා අනුරාධපුර අධ්‍යාපන කලාපවල පාසල් 44 ක පරිගණක විද්‍යාගාර සඳහා පරිගණක 375 ක් ලබා දී තිබුණු නමුත් එකී පාසල් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු ගුරුවරු අනුයුක්ත කර නොතිබීම හේතුවෙන් එකී පරිගණක විද්‍යාගාර නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) අනුරාධපුර අධ්‍යාපන කලාපයේ පාසල්වල 06-11 ශ්‍රේණිවල ගුරු අතිරික්තතා 263 ක් ද, ගුරු ඌනතා 152 ක් ද වූ අතර නගර ආසන්න පාසල් 04 ක එකී ශ්‍රේණිවල ගුරු අතිරික්තතා 48 ක් විය.

6.12.3 රෝහල් කාර්යය මණ්ඩලයේ අනුමත, තථ්‍ය, අතිරික්ත හා ඌණතා පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | අනුමත | තථ්‍ය | අතිරික්තය | ඌණතාවය |
|---|---|---|---|---|---|
| (i) | විශේෂඥ වෛද්‍ය නිලධාරී | 21 | 09 | | 12 |
| (ii) | ශ්‍රේණි වෛද්‍ය නිලධාරී | 356 | 278 | | 78 |
| (iii) | අනෙකුත් වෛද්‍ය නිලධාරී | 85 | 90 | 5 | - |
| (iv) | හෙද නිලධාරී (රෝහල්) | 590 | 464 | | 126 |
| (v) | හෙද නිලධාරී (මහජන සෞඛ්‍ය) | 31 | 19 | | 12 |
| (vi) | මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් | 182 | 222 | 40 | - |
| (vii) | කම්කරු (සාමාන්‍ය) | 329 | 225 | | 104 |
| (viii) | කම්කරු (සනීපාරක්ෂක) | 350 | 234 | | 116 |
| (ix) | උපස්ථායක | 435 | 334 | | 101 |
| | | 2379 | 1875 | 45 | 549 |

## 6.13 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 04 ට අනුයුක්ත වාහන 25 ක ධාවන මාපක ක්‍රියා විරහිතව පැවතුණි.

(ආ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් වාහන 02 ක් 2012 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු නමුත්, එම වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

6.14 බැංකු සැසඳුම්

------------------

පහත නිරීක්ෂණයන් විය.

(අ) අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 03 ක බැංකු ගිණුම් 05 කට අදාලව තැන්පත් කර මාස 06 ක කාලයක් ඉක්මවා උපලබ්ධි වී නොතිබුණු රු.1,082,578 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 188 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 19 ක බැංකු ගිණුම් 28 කට අදාලව නිකුත් කර මාස 06 ක කාලයක් ඉක්මවා ඇතත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණු රු.11,415,729 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 03 ක බැංකු ගිණුම් 05 කට අදාල හඳුනා නොගත් බැර රු.5,457,864 ක් වූ අතර බැංකු ගිණුම් 07 කට අදාල හඳුනා නොගත් හර රු.713,094 ක් විය.

07. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------------

7.1 ක්‍රියාකාරී සැලැස්ම

----------------------

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) හා 2010 මාර්තු 10 දිනැති චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව පළාත් සභාව සහ එහි එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ ආයතනය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කර නොතිබුණි.

7.2 අභ්‍යන්තර විගණනය

-------------------------

පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල වැරදි හා වංචා වැලැක්වීම සඳහාත්, වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, හඳුන්වා දී ඇති පද්ධති හා පාලන ක්‍රමවල දුර්වලතාවයන් හඳුනාගෙන එකී දුර්වලතාවයන් සහ ඒවා මඟහරවා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග ඉහළ කළමනාකරණයට වාර්තා කිරීම පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වුවත් එක් එක් වර්ෂවල විගණන හා විමර්ශන කාර්යය භාරයන් පැවරීම පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, අධිකාරී ඇතුළු සියළුම ආයතනවල අභ්‍යන්තර පාලනයන්හි ප්‍රධාන අඩුපාඩු හඳුනාගත හැකිවන ලෙස එය සිදුකර නැති බව සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන විමසුම්වලින් තහවුරු විය.

7.3 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු යටත් පිරිසෙයින් කාර්තුවකට එක් වරක් හෝ පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවේ එක් එක් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් එකී කමිටු රැස්කර තිබුණේ එක් වරක් බැගින් පමණි.

7.4 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් 2013 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

08. පද්ධති හා පාලන

---------------------

8.1 පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් වටිනාකම රු.443,220 ක් වූ ඩිජිටල් කැමරා 03 ක් සහ ඡායා පිටපත් යන්ත්‍ර 03 ක් ගබඩාවට ලබා නොගෙන මිලට ගත් නිලධාරියා විසින්ම විවිධ පුද්ගලයන් හා අංශ වෙත භාර දී තිබුණි.

8.2 පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහිද විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඈ) ස්ථාවර වත්කම්
(ඉ) අරමුදල් උපයෝජනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම
(ඌ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(එ) ගබඩා පාලනය
(ඒ) පැමිණීම හා අතිකාල පාලනය